052910
2015/07/21
ML/PR
D-827

# භාරතීය නව නර්තන කලාවට කථක් නර්තන කලාවේ දායකත්වය

නම :- ඩබ්.එම්.වී.කේ. දසනායක

ලියාපදිංචි අංකය :- DD/MA/DA/09/015

වර්ෂය :- 2009/2010

# හැඳින්වීම

භාරතීය සාම්ප්‍රදායික නර්තන කලාවන්, ගැමි නර්තන කලාවන්, බටහිර නර්තන සම්ප්‍රදායයන් ගෙන් භාරතීය නව නර්තන සම්ප්‍රදායක් නිර්මාණය වී පෝෂණය විය. නව නර්තන සම්ප්‍රදායෙහි ප්‍රගමනයට කථක් නර්තන සම්ප්‍රදාය කොතරම් දායක වී තිබේද යන්න විමර්ශනය කිරීම අපගේ අරමුණ විය.

සම්ප්‍රදායයක් බිහි වන්නේ පරම්පරා කිහිපයක් විවිධ වූ වෙනස්වීම්වලට භාජනය වී එය අඛණ්ඩව නොනැසී පවත්වා ගැනීමෙනි. භාරතයේ සෙසු සාම්ප්‍රදායික නර්තන කලාවන් අතරට එක්වන්නේ පරම්පරා ගණනාවක් අඛණ්ඩව විවිධ සට්ටනයන්ට භාජනය වුවත් වර්තමානය දක්වා පැවත ඒම නිසාවෙනි. පළමුවන පරිච්ඡේදයේදී හින්දු ආගම කේන්ද්‍ර කරගනිමින් ප්‍රභවය ලැබූ කථක් නර්තන සම්ප්‍රදායයේ ආරම්භය පිළිබඳව ශාස්ත්‍රීය පදනමකින් විග්‍රහයක යෙදේ. කථක් නර්තන සම්ප්‍රදායේ විකාශනය අතර විභේධනය වූ ගුරුකුල සම්ප්‍රදායයන් වන ලක්නව්, ජායිපූර්, බෙනාරස්, රායිඝර් ආදී ගුරු කුල බිහිවීමට තුඩු දුන් දේශපාලනමය, සමාජමය හා සංස්කෘතික තොරතුරු පිළිබඳව සාකච්ඡා කෙරේ.

13 වන සියවසේ භාරතයට බලපෑ මූගල් ආක්‍රමණය නිසා එම යුගයේ සමාජයේ ඇති වූ විවිධ වෙනස්වීම් කථක් නර්තනයට ද බලපෑ ආකාරය පිළිබඳව තොරතුරු එක් රැස් කර ඇත. කථක් නර්තනයේ ස්වර්ණමය යුගය වූ මූගල් යුගයේ දී නර්තනයට හා නර්තන ශිල්පීන්ට හිමි වූ ඉහළ සමාජයීය පිළිගැනීම පිළිබඳ කරුණු ගොනු කෙරිණි. මූගල් අවධියෙන් පසු බ්‍රිතාන්‍ය කිරීටයට යටත් වන භාරත දේශය තුළ කථක් නර්තනය ''නාච්'' යන ආර්ථිකය පමණක් පදනම් කරගත් වෘත්තීය මට්ටමකට පරිවර්තනය වූ අතර එහිදී නර්තනය තිබූ ගෞරවණීය තත්ත්වය පරිහානියට පත් විය.

අභියෝගය බොහෝමයකට මුහුණ දුන් භාරතීය කථක් නර්තන කලාව එහි ගමන් මග තුළ නොනැවතී ගමන් කළේය. ගුරු ශිෂ්‍ය පරම්පරාවන්හි බිඳ වැටීමත් සමඟ අධ්‍යාපන මධ්‍යස්ථාන, කලා කේන්ද්‍ර, විශ්වවිද්‍යාල බිහිවීම හා ඒවායෙහි නර්තන පාඨමාලා ආරම්භ වීමට බලපෑ සමාජ, දේශපාලන, ආර්ථික සාධක පිළිබඳව සවිස්තරාත්මක විග්‍රහයක් කර ඇත. කථක් නර්තනයේ භාවිත නෘත්ත නර්තනාංග පිළිබඳව ප්‍රායෝගික කරුණු ඉදිරිපත් කරමින් මෙතෙක් දේශීය ලිඛිත භාෂාවෙන් රචනා නොවූ ඌපජ්, උටාන්, යති වැනි පාරිභාෂිත වචන පිළිබඳ පැහැදිලිව අර්ථයන් දක්වා ඇති අතර නෘත්‍ය නර්තනාංගයන් පිළිබඳව තොරතුරු ඒකරාශී කර තිබේ.

නෘත්ත හා නෘත්‍ය දෙකොටසම අයත් වන බාදල් පරන්, බිජිලි පරන්, පක්ෂී පරන් යනාදී විශේෂිත පරන් පිළිබඳ අවධානය යොමු කෙරිණි. ඊට අමතරව නෘත්‍ය නර්තනාංග අතරට භාව රංගයන් වන ඨුම්රි, ගසල්, දදරා, භජන්, හෝලි පිළිබඳව සාධනීය දත්ත සටහනක් (වගුවක්) අප විසින් නිර්මාණය කළෙමු. එතුළින් සාම්ප්‍රදයික කථක් නර්තනයේ නෘත්ත, නෘත්‍ය, නාට්‍ය රංග අවස්ථා පිළිබඳව නිරවුල් අවබෝධයක් ලබා ගත හැකිය. පළමු පරිච්ඡේදය තුළ කථක් නර්තනයේ ශාස්ත්‍රීය පදනම පිළිබඳව වඩාත් පුළුල් විග්‍රහයක නියැලී ඇත.

නූතන, නව්‍ය යන අරුතැති අද්‍යතන නව නර්තන කලාවේ ප්‍රභවය පිළිබඳව දෙවන පරිච්ඡේදයේදී සාකච්ඡා කෙරේ. සාම්ප්‍රදයික නර්තන කලාව නිර්මාණකරණය කර ගැනීම නර්තන ගුරු කුල සම්ප්‍රදය තුළින් සිදු වී ඇති බව පෙන්වා දී තිබේ. නූතනයේ නව නර්තනය බිහි වන්නේ සාම්ප්‍රදයික පසුබිම ඇසුරින් වීම පිළිබඳ විවිධ නිර්වචන ගෙන හැර දක්වා ඇති අතර සමකාලීන නර්තනය තුළ සාම්ප්‍රදයයේ සිට නූතන නර්තන ආකෘති බිහිවීමට නර්තන ඉරියව්, හැඩතල, සංගීතය, තේමාවන්, චලන, ව්‍යාකරණ, රංග වස්ත්‍රාභරණ, පසුතල නිර්මාණය, ආලෝකකරණ භාවිතයෙන් බව සාධක සහිතව අවධාරණය කෙරිණි.

භාරතය තුළ මුගල් රාජ්‍ය සමයෙන් පසු උදා වූ නව යුගයේ දී බ්‍රිතාන්‍ය පාලනයත් සමඟ භාරතීය සමාජය, දේශපාලන, ආගමික වශයෙන් පරිවර්තනය වීය. මෙහිදී වෙනස් වූ සමාජ අවශ්‍යතාවයන්ට අනුකූලව තම සීමා මායිම් බිඳ හෙළමින් නර්තනය සමාජගත විණි. භාරතයේ නව නර්තන කලාවක් නිර්මාණය කිරීමට බටහිර වේදිකාවේ රූත් සෙන්ට් ඩෙනිස්, ඇනා පවුලෝවාට අවශේෂව උදය ශංකර්, රුක්මණි දේවි අරුන් ඩේල්, මේනකා, රබීන්ද්‍රනාත් තාගෝර්, මහා කවි වල්ලතෝල් නාරායන් මෙනන්, ගෝපි ක්‍රිෂ්ණා, ඊ. ක්‍රිෂ්ණ අයියර් වැනි ශ්‍රේෂ්ඨ කලා ශිල්පීන් රැසකගේ දයකත්වය ලැබී තිබේ. මොවුන්ගේ මූලිකත්වයෙන් බිහිවන භාරතීය නව නර්තන කලාව විවිධ සාම්ප්‍රදයික ග්‍රාමීය නර්තන සංයෝජනයකින් සිදු වූ අතර එයට කථක් නර්තනය දයක වූයේ ද යන්න පිළිබඳ තොරතුරු සම්පාදනය කර ඇත.

නූතන නෘත්‍ය නාටක, ගීත නාටක, චිත්‍රපට නර්තන වැනි විවිධ ක්ෂේත්‍රයන් තුළ නව නර්තනය ස්ථාපිත විය. ගීත සඳහා නර්තන නිර්මාණකරණයේදී කථක් නර්තනයේ භාවිතාව සහ එහි සාර්ථකත්වය පිළිබඳව සාකච්ඡා කෙරේ. සිනමාව උදෙසා නිර්මාණය වූ නව නර්තනයේදී භාවිත කළ නර්තන විධි ක්‍රම, සංගීතය, තාක්ෂණ ක්‍රම උපායන් පිළිබඳව තොරතුරු සාකච්ඡා කර තිබේ. සිනමාව මෙන්ම රූප මාධ්‍ය තුළ විකාශය වන ගීත සඳහා ද රූප රචනාවන් භාවිතය ඇරඹීය. එම ගීතවල ජනප්‍රියභාවය ඇතිවීමට රූප නිර්මාණයන් සඳහා කථක් නර්තනය භාවිත වූ ක්‍රමවේදය පිළිබඳව කරුණු ගෙනහැර දැක්වීම දෙවන පරිච්ඡේදයේදී අපේක්ෂා කෙරිණි.

භාරතීය නව නර්තන කලාවේ ආරම්භය විසිවන සියවසේදී සිදු වූ අතර සාම්ප්‍රදයික කථක් නර්තනය ඔස්සේ නව නර්තනය නිර්මාණය කළ ශිල්පීන් ගේ අභිප්‍රාය වූයේ නව මංපෙත් ඔස්සේ

කථක් නර්තනය ජන සමාජ තුළ ජනප්‍රිය කරවීම බව පෙනී යයි. මෙහිදී විසිවන සියවසේ කථක් නර්තනයේ පෝෂණයට විවිධ මාධ්‍යයන් ඔස්සේ වර්ධනය වූ බව සාකච්ඡා කර ඇත. බටහිර නර්තන ශෛලීන්ගේ ආභාෂය ලබමින් නව නිර්මාණකරණයේ යෙදුනු ශිල්පීහු වූ අතර කථක් නර්තනය විශ්වීය තලයකට ගෙන ගිය ශිල්පීන් හා කථක් මාධ්‍යය කර ගනිමින් නව නර්තන නිර්මාණකරණයේ යෙදුනු උදය ශංකර්, මේනකා රෝයි, ගුරු ලච්චු මහාරාජ්, කුමුදුනී ලාකියා, පණ්ඩිත් බිර්ජු මහාරාජ්, මායා රාඕ සහ පණ්ඩිත් චිත්‍රේස් දස් යන ශිල්පීන් ගේ නිර්මාණදයකත්වයන් සහ ඔවුන්ගේ ශ්‍රේෂ්ඨ නිර්මාණ කෘති පිළිබඳ තොරතුරු තෙවන පරිච්ඡේදයේදී සාකච්ඡා කෙරේ.

බොම්බායි/මුම්බායි නගරය කේන්ද්‍ර කර ගනිමින් හින්දි භාෂාව ප්‍රධාන මාධ්‍යයක් කර ගනිමින් ගොඩනැගුණු බොලිවුඩ් සිනමාව සඳහා නිර්මාණය වූ නර්තනයන්ට උපයෝගි කොටගත් කථක් නර්තනයේ දයකත්වය පිළිබඳ තොරතුරු ගවේෂණය කෙරුණි. 'කල්පනා' චිත්‍රපටයේ සිට 'පාකීසා', 'උම්රාඕ ජාන්', 'මහල්', 'මුගලෙ-ඊ-ආසම්' වැනි චිත්‍රපට මෙන්ම වර්තමානයේ ''මොන්සූන් වෙඩින්'', ''මංගල් පාණ්ඩේ', 'දිල්තෝ පාගල් හෛ', 'ජෝද අක්බර්', 'දේව්දස්' වැනි චිත්‍රපටයන්හි නර්තන නිර්මාණයන් පිළිබඳ සිව්වන පරිච්ඡේදයේදී නිදර්ශනාත්මකව සාකච්ඡා කෙරේ. අප පර්යේෂණ කාර්යයේදී සොයා ගන්නා ලද තොරතුරු අතර ඉතාම වැදගත්ම දත්තයන් අන්තර්ගත කර තිබේ. ඒ අද්‍යතන නව නර්තනයේ සහ කථක් නර්තනයේ වේදිකා සංරචනය තුළ නිර්මාණය වූ නව සොයා ගැනීම් වේ. එනම් සමකාලීන කථක්, ෆැලැමින්කෝ කථක්, ෆියුෂන් කථක්, ටැප් කථක්, යෝග කථක් සහ සූෆි කථක් යන නව නර්තන කලාවන් පිළිබඳව තොරතුරු ගවේෂණාත්මකව සම්පාදනය කර තිබේ.

අවසාන පරිච්ඡේදයේදී සාම්ප්‍රදයික කථක් නර්තනය සහ නව නර්තන කලාව අතර ඇති සහසම්බන්ධය පිළිබඳව තුලනාත්මකව විග්‍රහ කෙරිණි. සාම්ප්‍රදයික නර්තන කලාවේ වස්තුබීජයන් සහ සාම්ප්‍රදයන්හි සාධනීය ලක්ෂණ එකතු වීමෙන් නිර්මාණය වූ නව නර්තන කලාවේදී සම්ප්‍රදයයේ ගති ලක්ෂණ හා භාවිත වූ අංග ලක්ෂණ එකතුවීමෙන් නිර්මාණය වූ නව නර්තන කලාවේදී සම්ප්‍රදයයේ ගති ලක්ෂණ හා භාවිතා වූ අංග ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කෙරුණු අතර සමාජයේ සෑම තරාතිරකම ප්‍රේක්ෂකයකුටම රසවින්දනය කර ගැනීමට හැකි අයුරින් සංකීර්ණත්වයෙන් සරල නිර්මාණයන් බිහි කරමින් නව නර්තන කලාව බිහිවීය. මෙහිදී නව්‍යකරණයට භාජනය වන සම්ප්‍රදයික කථක් නර්තනය තුළදී ද කාලය කළමනාකරණය වීම නිසා ආකර්ෂණීය නර්තනාංගවල භාවිතය සුලභවීම, චලන රේඛාවන්, ඉරියව් හා රංග රටාවන් ගේ වෙනස්වීම් පිළිබඳව නිරීක්ෂණය විය. භාරතීය නව නර්තන කලාවේ අනාගතය හා කථක් නර්තන කලාවේ වර්තමාන මුහුණුවර පිළිබඳ තර්කානුකූලව කරුණු අවසන් වශයෙන් ගෙනහැර දක්වා ඇත.